28 වන පිටෙන්

එතැන් පටන් සිංහල සිනමාවට ඔහුගේ දායකත්වය අතිමහත්ය. වර්ෂ 1962 දී ශාන්ති කුමාර් සෙනෙවිරත්නගේ සංසාරේ චිත්‍රපටයේ ගීත තුනක් නිර්මාණය කරමින් සිය සිනමා ගී තනු නිර්මාණ දිවිය ඇරැඹූ රොක්සාමි පසුව් සුහඳ සොහොයුරෝ (1963), ධීවරයෝ චණ්ඩාලී (1964) ශීලා, සොඳුරු සුවඳ, මහ රෑ හමුවූ ස්ත්‍රිය, සැකයි (1965), කපටිකම් (ගීත කිහිපයක්) (1966), රන් රසි (1967), සිංහිති සුරතලී (1968), ආත්ම පූජා, ඔහොම හොඳදි (1970), හාරලක්ෂයි (1971), එදත් සූරයා අදත් සූරයා (1972), සිරිල් මල්ලී(1975), කවුද රජා, හරිම බඩු තුනකි(1976), සකුන්තලා, දෙවියනි ඔබ කොහිදැ? (1977), රිකිරි, අප්සරා, (1978), කිරි සුවඳ (1982), රත්තරං කණ්ඩි (1985) ඇතුළු තවත් සිංහල චිත්‍රපටවලද පොන්මනී (ධර්මසේන පතිරාජ නිර්මාණය කළ සම්මාන දිනූ ලාංකික දෙවිඩ චිත්‍රපටය) ඇතුළු දෙවිඩ චිත්‍රපට සතරක් ද අපට රොක් මාස්ටර්ගේ ගී තනු නිර්මාණ හා සංගීත අධ්‍යක්ෂණය හැකියාව පසක් කර දෙයි.

රොක්සාමිගේ පෞද්ගලික ජීවිතය තුළින් මෙන් ම ඔහුගේ ගී තනු නිර්මාණ තුළින් ද තරමක් දුරට ජාතික සංගීදියාව මතු වෙයි. ඔහු, මොගිදීන් බෙග් ගැයූ සරවන බව කඳසුරිඳුගේ තෙද බලේ ගීතයේ පද හා දැඩිව බැඳෙන තනුවක් ඊට නිර්මාණය කරනු ලබන්නේ ඉන්දියානු දේව වන්දනා ශෛලිය තනුව තුළට කා වද්දමිනි. ඒ සඳහා ඔහු දකුණු ඉන්දියානු කර්නාටක් සංගීතය උපයෝගී කර ගනියි. හින්දු ආගම් සංස්කෘතියට එය මනාව බද්ධ වේ. දෙවියනි ඔබ කොහිදැ? චිත්‍රපටයේ වික්ටර් සහ සුජාතා ගැයූ ආදර පූජාසනේ ගීතයේ තනුවෙන් ද සංගීත මාලාවන්ගෙන් ද ධ්වනිත වන්නේ කිතුණු දෙව් මැදු රුවල ගැයෙන ගීතිකාවල හඬයි. මොගිදීන් බෙග් මාස්ටර් ගැයූ ඇවිල්ල ඇවිල්ලා සිංහල අවුරුද්ද ඇවිල්ලා (ධීවරයෝ චිත්‍රපටය) ගීතයේ මූලික රැව්මය සිංහල අවුරුදු සමයේ මෙරට නිරන්තරයෙන් ඇසෙන රබන් නාදයයි. එම ගීතයේ ඇතැම් තැනෙක කොහාගේ හඬ බව හලා ඇසුරින් මතු කර ඇත්තේ සිංහල ගැමිකමද සංගීතයට එක්කරමින්.

මිනිසාමයි ලොව දෙවියන් වන්නේ
මිනිසාමයි ලොව තිරිසන් වන්නේ
ඇසින් දුටු දේ බොරු වී නොයයිදෝ
දෙකනින් ඇසූ දේ නොවේ

ගී පද මාලාව කරුණාරත්න අබේසේකර සහ සංගීතය එම්.කේ. රොක්සාමි උපුටා ගැනීම ලසිරි පතුලි චිත්‍රපටියෙනි.

ඉහත ගීතය ඇතුලත් ලසිරි පතුලි සිංහල සිනමාවට දායාද කල කේ වෙන්කට් මහතාව පණ පිටින් තම මෝටර් රථය තුල 83 කළු ජුලිය තුල ගිහිබත් කරලීමට ලාංකීය දේශපාලන සංගිදියාවේ කැකෑරෙන ගිති පුපුරු සමත් වුනා සේම සිංහල ගීතයට සිංහල සිනමාවට තම ජීවිත රස දැනුම නිර්ලෝභීව දන් දුන්, රොක් අයියාගේ වැඩවලට ලැබුණු අත්තිකාරම් මුදල් වලින් එකතු කර තැනු කැදැල්ලද බිමට සමතලා කරන්න වෛරී ආත්මයන්ට හැකියාව ලැබුන.

"අපි නිවසින් පිටවී ගියේ කිසියම් මැර පිරිසක් පැමිණෙන බව ආරංචි වෙලයි. අපි කඳානේ මගේ මාමා කෙනෙක් ළඟට ගියා. දවසයි එහි සිටියේ. පසුදිනම කඳාන පොලිසියේ ස්ථානාධිපතිතුමා ලෙස සිටි රොක්සාමිට ගිතවත් සිංහල පොලිස් නිලධාරියෙක් පොලිසිය ඉදිරිපසම පිහිටි මිතුරකුගෙ නිවසේ ඔවුන් නතර කොට ආරක්ෂාව දුන්නා. ලදිනකට පසුව වැඩි ආරක්ෂාව පතා අපිව පත්තලගෙදර නම් ප්‍රදේශයේ පාඨශාලාවක කඳවුරක රැඳවූවා. කේමදාස මාස්ටර් කඳවුරු පිරා ගොස් රොක් ව සොයා ගන්නවා. ඊට සනත් ගුණාතිලක ගේ දායකත්වයද අඩු වැඩියෙන් ලැබෙනවා.

රොක් අයියා, කේමදාස මාස්ටර්ගෙන් අහනවා, " ඇයි සර් සිංහල මිනිස්සු මේ වගේ දෙයක් මට කළේ" කියලා. එයා ජීවත් වුණේ සිංහල මිනිස්සු එක්ක. සිංහල ගීතවලට තමයි තනු නිර්මාණය කළේ. මේ රටේ ජනී ජනයාගේ සවන්පත් වයලින් වාදනයෙන් සනහාලු එයාගේ වාදන භාණ්ඩ කෑලිවලට සුනු විසුනු වෙලා ගියේ නිල නොවන මරුය කම්පනයක් සදාතනිකව ඉතිරි කරමින්. ඊට අමතරව වාද්‍ය ශිල්පින් අතර වූ බෙදී යාමත් රොක් වැනි සංවේදී මිනිසෙකුට දිරවාගත නොහැකි විය. සිය ජීවිතයේ පසු කලෙක මඳ කළකිරීමකින් පසුවූ රොක්සාමි පෙරට වඩා මත්පැනට යොමු වූ බව කණගාටුවට කරුණක් වේ.

සිංහල සංගීතයට අමරුය සේවයක් කළ රොක්සාමි වැනි උදාර සංගීතඥයකුට ප්‍රතිභාසම්පන්න වාද්‍ය ශිල්පියකුට රාජ්‍ය උපහාරයක් නොලැබුන අතීතයේ සිට වර්තමාන ජාතික සංගිදියාව පිළිබඳ ගැඹුරු සංවාදයක තටමන ඔස්තර්ලා වෙසෙන යුගයක තවමත් රොක් අයියා පෙනී නොපෙනී ඔක්කාරයෙන් හිනාවෙයි.

යම් යහපත් දෙයක් ලොවට දීමට පාරමි දම් පුරන ගුණවත් මිනිසුන්ට හමුවන බාධක හා කම්කටොලු නිකම්ම ජීවත්වන මිනිසුන්ට වඩා බෙහෙවින් වැඩිය. රොකී සිය ජීවිත කාලය පුරාම මේ අන්දමින් බාධක සිනාවෙන් ඉවසා සිටියේය. සංගීත අසපුවේ මේ මුනිවරයා දැන් අප අතර නැත. එහෙත් ඔහු වයලීනයේ වෙණ තත් පාරා නින්නාද කළ රටාවන් මුළු විශ්වයට අඳටත් අඩු නැතිව ඇසෙයි, වර්තමාන සංගීත ප්‍රහාර සහ පෙර යුගයේ තිබූ මානසික රස සුවයේ වෙනස ගෙට දවසේ කාටත් තදින් දැනෙනු ඇත.

රැල්ල සිඹින වැල්ල අපට මෙහෙම කියනවා
අඳට වැඩිය එලිය හඳක් හෙට පායනවා
දෙතුන් දවස් කන්න නැතත් ශෝක නැහැ සිතේ
විනෝද මිහිරක් ගෙනදෙයි මුහුදු ජීවිතේ

ගී පද මාලාව කරුණාරත්න අබේසේකර සහ සංගීතය එම්.කේ. රොක්සාමි උපුටා ගැනීම 1964 දී තිරගතවූ ධීවරයෝ චිත්‍රපටියෙනි.

රොක් මාස්ටර්, තම සුන්දර තනු ඔස්සේ මිනිස් හද ලෙනෙහි තව දීගු කලක් ජීවමාන වනවා නිසැකයි.

ඒත්, හෙට දවසේ රොක් සාමි මාස්ටර් ද උපහාර මුහුණුවරකින් හෝ විකුණාන් කන්න වර්තමාන හැකියාවෙන් හීන සංගීත ආතුරයන් වලිකනු ඇත. මතක තබා ගන්න

මල්වඩම් අනවශ්‍යයි - රොක් ක්‍රිස්ටි සාමි තවමත් ජීවමානයි

අයිරීන් සහ හේම ශ්‍රී ද අල්විස් ඔබේ සහයෝගය ඔවුනට දෙන්න

අයිරීන් සහ හේම ශ්‍රී ද අල්විස් කලාකරුවන් දෙදෙනා පිළිබඳව 2017 ජනවාරි 7 වන දින උදෑසන 7ට ගුවන් ගත වූ "ශනිදා සාදය" වැඩ සටහන ඔස්සේ ප්‍රවීණ මාධ්‍ය වේදී අසෝක තිලකරත්න මහතා ඉදිරිපත් කළ වැඩ සටහනින් පසු මේ දෙපළට ආධාර කිරීමට හැකි ආකාරය විමසා දුරකතන ඇමතුම් විශාල සංඛ්‍යාවක් ලැබුණ බව "ශනිදා සාදය" කණ්ඩායම සන්නසට දන්වා සිටි අතර ඒ අනුව පහත දුරකතනය ඔස්සේ හේම ශ්‍රී ද අල්විස් මහතා සම්බන්ධ කරගත හැකි බව දන්වා සිටිමු

හේම ශ්‍රී ද අල්විස් - (ශ්‍රී ලංකාවේ අංකයකි) 077 5822 425

සිංහල ගීතය වෙනුවෙන් අති විශාල සේවයක් කළ මේ කලාකරුවන් දෙපළට අපේ කෘතවේදීත්වය පිළිගැන්වීමට මෙය ඉතා සුදුසුම අවස්ථාවයි

අදාල ශනිදා සාදය වැඩසටහනට මෙතැනින් සවන් දිය හැකිය
www.facebook.com/ShanidaaSaadaya/



සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන
තිසර ගුවන්විදුලිය www.thisara.com

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

(ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
DR. PREMA KUDALIGAMA
(BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com